භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
පරිසර අමාත්‍යාංශය

# ඇබෑර්තු

1992 අංක 33 දරණ පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මඟින් ස්ථාපිත කරනු ලැබූ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි පවත්නා පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් භාරගනු ලැබේ.

1. **භූ විද්‍යාඥ**
2. **කැණීම් ඉංජිනේරු**
3. **භූ භෞතික විද්‍යාඥ**
4. **භූ කම්පන විද්‍යාඥ**
5. **සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්)**
6. **සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)**
7. **සහකාර අධ්‍යක්ෂ(ඛනිජ සමීක්ෂණ)**
8. **සහකාර අධ්‍යක්ෂ (විද්‍යාගාර හා භෞතික සමීක්ෂණ)**
9. **සහකාර අධ්‍යක්ෂ ( පාරිසරික බලපෑම් ඇගයීම් සහ ප්‍රාදේශීය)**

1. **භූ විද්‍යාඥ**

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**
**<u>බාහිර අයදුම්කරුවන්</u>**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත්, රසායන විද්‍යාව/භෞතික විද්‍යාව /පරිගණක විද්‍යාව/ ජීව විද්‍යාව අනු විෂයයක්/විෂයන් ලෙස සමත්, පළමු හෝ දෙවන පෙල පංති සාමර්ථයක් සහිත භූ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක්

සහ

**<u>සේවා පළපුරුද්ද</u>**
ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව භූ විද්‍යා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1. හෝ 2.)</u>**
**<u>අධ්‍යාපන</u>**
1. ඉහත සඳහන් කර ඇති පරිදි බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍යවන සුදුසුකම් සපුරා තිබීම.

**<u>සේවා පළපුරුද්ද</u>**
2. භූ විද්‍යා ක්ෂේත්‍රයේ "කණිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ" (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2. **කැණීම් ඉංජිනේරු.**

**<u>බාහිර අයදුම්කරුවන් (පහත 1. හෝ 2.)</u>**
**<u>අධ්‍යාපනික</u>**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත්, කැණීම් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක්.
2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් භූ සම්පත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක්.

සහ

**<u>සේවා පළපුරුද්ද</u>**
ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව කැණීම් ක්ෂේත්‍රයට අදාලව අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1. හෝ 2.)</u>**
**<u>අධ්‍යාපන</u>**
1. ඉහත සඳහන් කර ඇති පරිදි බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍යවන සුදුසුකම් සපුරා තිබීම (ඉහත 1 හෝ 2).

**<u>සේවා පළපුරුද්ද</u>**
2. කැණීම් ක්ෂේත්‍රයේ "කනිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ" (JM 1- 1) තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3. භූ භෞතික විද්‍යාඥ**

**<u>බාහිර අයදුම්කරුවන්</u>**
**<u>අධ්‍යාපන</u>**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත්, භෞතික විද්‍යාව අනු විෂයක් ලෙස සමත් පළමු හෝ දෙවන පෙළ පංති සාමර්ථයක් සහිත භූ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය

සහ

**<u>සේවා පළපුරුද්ද</u>**
ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව භූ භෞතික ක්ෂේත්‍රයට අදාලව අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)</u>**
**<u>අධ්‍යාපන</u>**
1. ඉහත සඳහන් කර ඇති පරිදි බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍යවන සුදුසුකම් සපුරා තිබීම.

**<u>සේවා පළපුරුද්ද:</u>**
2. භූ භෞතික ක්ෂේත්‍රයේ "කණිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ" (JM 1- 1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා සම්පූර්ණ කර තිබීම.

**4. භූ කම්පන විද්‍යාඥ**

**බාහිර අයදුම්කරුවන්**
**අධ්‍යාපන**
1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් භූ භෞතික විද්‍යාව අනු විෂයක් ලෙස සමත්, පළමු හෝ දෙවන පෙල පංති සාමර්ථයක් සහිත භූ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය

සහ

**සේවා පළපුරුද්ද:**
2. ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව භූ කම්පන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1. හෝ 2.)**
**අධ්‍යාපනික:**
1. ඉහත සඳහන් කර ඇති පරිදි (ඉහත 1 හෝ 2) බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

**සේවා පළපුරුද්ද:**
2. භූ කම්පන ක්ෂේත්‍රයේ "කණිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ" (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**5. සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්).**

**බාහිර අයදුම්කරුවන්**
**අධ්‍යාපන**
1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගත් මානව සම්පත් / කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / වාණිජ්‍යය පිළිබඳ උපාධියක්.

සහ

**සේවා පළපුරුද්ද:**
ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව මානව සම්පත් / පරිපාලන / කළමනාකරණ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් අනතුරුව අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1. හෝ 2.)**
**අධ්‍යාපන**
1. ඉහත සඳහන් පරිදි බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.

**සේවා පළපුරුද්ද:**
3. මානව සම්පත් / පරිපාලන ක්ෂේත්‍රයේ "කණිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ" (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

6. **සහකාර අධ්‍යක්ෂ (පරිපාලන).**

**බාහිර අයදුම්කරුවන්**
**අධ්‍යාපනික:**
1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගත් මානව සම්පත් / කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / වාණිජ්‍යය පිළිබඳ උපාධියක්.

සහ

**<u>සේවා පළපුරුද්ද:</u>**
ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව මානව සම්පත් / පරිපාලන / කළමනාකරණ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් අනතුරුව අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1. හෝ 2.)</u>**
**<u>අධ්‍යාපන</u>**
1. ඉහත සඳහන් පරිදි බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.

**<u>සේවා පළපුරුද්ද:</u>**
2. මානව සම්පත් / පරිපාලන ක්ෂේත්‍රයේ “කණිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ” (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**7. සහකාර අධ්‍යක්ෂ (ඛනිජ සමීක්ෂණ).**
**බාහිර අයදුම්කරුවන්**
**අධ්‍යාපන**
1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත්, රසායන විද්‍යාව / භෞතික විද්‍යාව / පරිගණක විද්‍යාව / ජීව විද්‍යාව යන අනු විෂයක්/විෂයන් සමත් පළමු හෝ දෙවන පෙළ පන්ති සමාර්ථයක් සහිත භූ විද්‍යාව පිළිබඳ (විශේෂ) උපාධියක්.

සහ

**සේවා පළපුරුද්ද**
2. ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව ඛනිජ සමීක්ෂණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**<u>අභ්‍යන්තර අපේක්ෂකයින්. (පහත 1. හෝ 2.).</u>**
**<u>අධ්‍යාපන</u>**

1. ඉහත සඳහන් පරිදි බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.

**<u>සේවා පළපුරුද්ද:</u>**

2. ඛනිජ සමීක්ෂණ ක්ෂේත්‍රයේ “කණිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ” (JM 1-1) තනතුරක අවම වශයෙන්
වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**8. සහකාර අධ්‍යක්ෂ (විද්‍යාගාර සහ භෞතික පරීක්ෂණ).**

**<u>බාහිර අයදුම්කරුවන් (පහත 1. හෝ 2. සහ 3).</u>**
**<u>අධ්‍යාපන</u>**
1.විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත්, පළමු හෝ දෙවන සාමාර්ථයක් සහිත රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය

2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, රසායන විද්‍යාව සහ භූ විද්‍යාව විෂයයන් ඇතුලත් පළමු හෝ දෙවන ඉහළ පෙළ පන්ති සමාර්ථයක් සහිත විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය

සහ

**සේවා පළපුරුද්ද:**
3. ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව විද්‍යාගාර විශ්ලේෂණ කටයුතු සම්බන්ධව අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1. හෝ 2.)**
**අධ්‍යාපන**

1. ඉහත (1 හෝ 2) සඳහන් කර ඇති පරිදි බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.

**සේවා පළපුරුද්ද:**

2. විද්‍යාගාර විශ්ලේෂණ කටයුතු ක්ෂේත්‍රයේ "කණිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ" (JM 1-1) තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**9. සහකාර අධ්‍යක්ෂ (පාරිසරික බලපෑම් ඇගයීම් සහ ප්‍රාදේශීය).**

<u>බාහිර අයදුම්කරුවන් (පහත 1. හෝ 2. සහ 3)</u>
<u>අධ්‍යාපන:</u>
1.විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත්, කැණීම් හා ඛනිජ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය
2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් භූ සම්පත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය.

සහ

**සේවා පළපුරුද්ද:**
3. ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව පාරිසරික බලපෑම් ඇගයීම් සහ ප්‍රාදේශීය පරිපාලනය පිළිබඳ අවම වශයෙන් වසරක (01) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (1. හෝ 2.)**
**අධ්‍යාපන**
1. ඉහත (1. හෝ 2.) සඳහන් පරිදි බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම.

<u>**සේවා පළපුරුද්ද:**</u>
2 පාරිසරික බලපෑම් ඇගයීම් සහ ප්‍රාදේශීය පරිපාලන ක්ෂේත්‍රයේ "කණිෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ" (JM 1-1) තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**වැටුප් පරිමාණය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව**

MM1-1 91,690-2,480x10-3,450x15-168,240+ ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් අනුමත දීමනා
2027.01.01 දින දක්වා සියලුම බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා වැටුප MSD චක්‍රලේඛ අංක 01/2025 හි II වන උපලේඛනයට අනුකූල විය යුතුය.

වයස් සීමාව: වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහත වයස් සීමාව අදාළ නොවේ.

තනතුරු සඳහා අදාළ වන පොදු කොන්දේසි:
1. සෑම අයදුම්කරුවෙකුම
• ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

• තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය
• ඉහළ සදාචාරාත්මක චරිතයක් තිබිය යුතුය.
2. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානීන් හරහා තම අයදුම්පත එවිය යුතුය.
3. ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක අයදුම්කරු පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ජීවදත්ත වාර්තාවේ සඳහන් කළ යුතුය.
4. අධ්‍යාපනික සහ අනෙකුත් සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය.
5. කෙටි ලැයිස්තුගත කිරීමෙන් අනතුරුව අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

- තෝරාගත් අයදුම්කරුවන් තම වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක විය යුතුය. කාර්යාංශය විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) 15% ක් සහ සේවක භාර අරමුදලට (ETF) අමතර 3% ක් ලබා දෙනු ඇත.
- අනෙකුත් ප්‍රතිලාභ;

• රෝහල් වෛද්‍ය රක්ෂණ ක්‍රමයට හිමිකම් ලැබීම
• බාහිර රෝගී වෛද්‍ය බිල්පත් වල මුදල් ප්‍රතිපූර්ණයට හිමිකම් ඇත.
• රජයේ අනුමත දීමනා.

අයදුම් කරන තනතුර අයදුම්පත අඩංගු කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු අතර, 2025.11.01 දින හෝ ඊට පෙර ලැබීමට ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**භූ විද්‍යා සමීක්සණ හා පතල් කාර්යාංශය**
**569, එපිටමුල්ල පාර,**
**පිටකෝට්ටේ.**